# 6 කිරි කැඳ

ප්‍රවීණ දමිළ කෙටිකතාකරුවකු වන සී. වෛතියලිංගම් මහතාගේ කෙටිකතාවක් මේ පාඩමට ඇතුළත් වේ. මේ කෙටිකතාව 'කිරි කැඳ' නමින් සිංහලයට පරිවර්තනය කර ඇත්තේ ප්‍රවීණ ලේඛක මඩුළුගිරියේ විජේරත්න මහතා විසිනි.



"රාමු, මගේ රත්තරනේ. බොන්න. කෝ මම ඇස් පියා ගන්නං බොන්න බලන්න. හෙට කිරි කැඳ හොඳ ද?''

"නිකන් ඉන්න අම්මේ. හෙට හෙට කියලා දැන් කී දවසක් කී සැරයක් කීවා ද? මොනවා කිව්වත් මේ සුනුසාල් කොළ කැඳ නම් බොන්නේ නැහැ අම්මේ."

"මේ සාගතය තව කී දවසකට ද? වෙලේ ගොයම් පැහිලා කිරි වැදිලා සරුවෙලා තියෙනවා. ඔයාට එපා වෙනකම් බොන්න මම කිරි කැඳ දෙන්නම්."

''මේ කැඳ දැක්කා ම මගේ බඩ දඟලනවා. බැහැ කිව්වොත් බැහැමයි.'' යනුවෙන් ඔහු අඬන්න පටන් ගත්තේ ය.

"තාත්තා බඩගින්නේ වෙලේ බලාගෙන ඉන්නවා. මේ කැඳ ගෙනියන්න ඕනේ. මොන දුක විඳලා හරි හෙට මම කැඳ දෙන්නම්. අනේ මගේ රත්තරනේ....."

''ඔයා කියන්නේ ඇත්තම ද අම්මේ? හෙට කිරි කැඳ දෙනවා ද? අම්මේ හෙට කිරි කැඳ දෙනවා ද අම්මේ."

ක්ෂණයකින් ඒ අසල මිදුලේ ළමයින් සමූහයක් කුරුල්ලන් අල්ලමින් සෙල්ලම් කරනු ඇසිණ. රාමු හනි හනිකට කැඳ උගුරු දහයක් ගිල දැම්මේ ය. සෑම දෙයක් ම අමතක කර දමා සෙල්ලම් කිරීම පිණිස දිව ගියේ ය.

එම ග්‍රාමයේ කුඹුරුවලින් ඉතා සරුවට අස්වැන්න ගෙනදෙන කුඹුරක් මුරුගේසු සතු ව ඇත්තේ ය. එම කුඹුර අසල ම වැව පිහිටා තිබේ. මේ වැව වටේට ම ඉතා සාරවත් ව තිඹිරි ගස් වැවී තිබුණේ ය. ඈතට ම වන්නට අම්මාන් දෙවියන් උදෙසා ඉදිවුණ කෝවිල් කුළුණකි. මේ සියලු දෙයක් ම වට කර වැටක් බැන්ද සේ පැල්පත් නිදියමින් සිටින සෙයක් පෙනේ.

උඳුවප් මාසය ගෙවී ගියේ ය. මේ සමයේ ආකාසයේ වලාකුළු ගමන් ගන්නේ නැත. ඔව්....

සම්පූර්ණ ග්‍රීෂ්ම ඍතුවේ ම නිදි කිරමින් සිටි ජීවීහු සියල්ලෝ ම ගී ගයමින් වැඩ ඇරඹුවෝ ය. මුරුගේසු ද කුඹුරෙහි වැඩ කරමින් සිටියේ ය. පින්නෙන් තෙතමනය ලැබූ නහරවැල්වලට හිරු එළිය වැටීමෙන් කඩිසර බවක් ඇති විය. ඉලිප්පී පෙරී ගිය නහරවැල් මනාව දිස් විණ. නැගී සිටගෙන දෙනෙත් ඒ මේ අත කරකවා තමාගේ කුඹුර දෙස බැලුවොත් බණ්ඩි ගොයමෙහි කිරි සිදී හරිත වර්ණයත් කහපාටත් එකට මිශ්‍ර වී රන්වන් පාටට හැරෙමින් තිබිණ. තවත් දින පහළොවකින් පස්සේ..... ඔහුට නොදැනී ම වචන පිට විය.

මුරුගේසුගේ මනස එක්තරා සතුටකින්, සැනසීමකින්, චිත්ත විවේකයකින් මෝදුවෙමින් තිබිණ. ඔහු වර්ෂයක් පුරා ම දැරූ මහන්සිය අපතේ ගියේ නැහැ නොවේ ද? යනුවෙන් ශෝකයත් සතුටත් මිශ්‍ර වූ එක්තරා සුසුමක් ඔහු තුළ හට ගත්තේ ය.

මුරුගේසුට කුඹුර අත හැර දමා යන්නට සිතුණේ නැත. ඉර මුදුන් විය. බඩගින්න කුස කෙනිත්තුවේ ය. එසේ වුවත් ගොයම් තුළට වැදුණු ඔහු තම අත්වලින් එක් එක් වී කරල් තම දරුවන් සේ ඇකයට තුරුලු කර ගත්තේ ය. ඇස් ඇර බැලීමට නොහැකි ගිනි අව්වේ සුන්සාල් කැඳත් රැගෙන ඒ මොහොතේ කාමාච්චි එමින් සිටියා ය. කැඳ බීමට බලා සිටින අතරතුරේ දී මුරුගේසු ඇය දෙස බලා ''ගිය අවුරුද්දේ තමයි වැස්ස නැති ව ඔක්කෝම බොල්වලටයි ඇගිටිවලටයි පත් වුණේ.

කාමු අර බලන්න. මේ අවුරුද්දේ දෙවියෝ ඇස් ඇර බැලුවා. කරුප්පන්ගේ ණය ඔක්කෝම බේරලා දමන්න පුළුවන්. අපිට අවුරුද්දක් ම බත්වලින් අඩුවක් වෙන්නේ නැහැ. අපේ රාමුට වළලු ජෝඩුවක් අරන් දෙන්න ඕනේ."

"මටත් හවඩියක්."

"ඇයි හොඳ කපු සාරියක් හොඳට ඇති නේ ද?"

"ඔව් මට සාරියක්. එහෙනම් ඔයාට රත්තරන් වාටියක් අල්ලා තියෙන සාළුවක් ඕනේ නේ ද?"

"ෂහ්.... දෙන්නාම ආවොත් අලුත් මනමාලයකුයි මනාලියකුයි වාගේ''. කාමාච්චි ලජ්ජාවෙන් තමාගේ රෙද්දේ අගිස්සෙන් මුහුණ අඩවන් කර වසා ගෙන. "ඒ ඔක්කෝම තිබ්බිච්චාවෙයි. කවදද අස්වැන්න කපන දවස තියා ගන්න යන්නේ" යැයි ඇසුවා ය.

''අද සෙනසුරාද. ඊළඟ පහළොස්වෙනි සෙනසුරාද හොඳ දවසක්, එද ගොයම් කැපිල්ල තියා ගනිමු."

"දෙයියනේ මේ අතර කාලයට කිසිදු කරදරයක් එන්න හොඳ නැහැ." යනුවෙන් ඔහු තම හදවතට ම කියා ගත්තේය.

සුබ උත්සවයක් බලාපොරොත්තුවෙන් සිටින්නාක් මෙන් කාමාච්චිත්, මුරුගේසුත් ගොයම් කපන දිනය බලාපොරොත්තු වෙන් සිටියෝ ය. කාමාච්චි තම නිවසෙහි වී දමන කාමරයේ ගොම මිශ්‍ර පස් ගා කෝලම් දමා අලංකාර කළා ය. ලක්ෂ්මිය කැන්දන එම කාමරයට දිනපතා ම පහනක් දැල්වූවා ය. මුරුගේසු මළකඩ කා, තිබුණ දෑකැති සියල්ල ශුද්ධ පවිත්‍ර කර කම්හලට ගෙන ගොස් මුවහත් කරගෙන ආවේ ය. ගොයම් දමන පැදුරු සියල්ල අව්වේ දමා වියළා ඒ උඩින් තල් කොළ තැබුවේ ය. දින පහකට හයකට පෙර අල්ලපු ගෙවල්වල තම මිත්‍රයින් වන කන්දයියාටත්, ගෝවින්දන්ටත් "ගොයම් කපන්න එන්න ඕනේ" යනුවෙන් ඔහු ගොයම් කපන දිනය ගැන කිහිප වතාවක් ම මතක් කළේ ය. දෙදෙනාගේ ම හදවත්වල සතුට මෝදු කරමින් මේ සියල්ල ම කරගෙන ආවේ ය.

ගොයම් කපන දිනයට පෙර දිනය සිකුරාදවකි. දවාල මැකී ගෙවී යන්ට තිබුණේ තවත් දින තුනකි. නිස්කලංක ව තිබූ අහස එකපැත්තක අඳුරු වලාවන්ගෙන් පිරී ගියේ ය. වේලාව යත් ම එය තීව්‍ර වෙමින් කළු කරගෙන ආවේ ය. ඒ වලාපෙළ එකතු වී මුරුගේසුට විනයක් කරන්න හදනවා නොවේ දැයි මුරුගේසු සිතුවේ ය. ඒ අඳුරු අහස ඔහුගේ හදවතටත් අඳුර එක් කළේ ය. කාමාච්චි අම්මාන් දෙවියන්ට වතුර බාල්දි සියයකින් අභිෂේකයක් පවත්වන බවට බාර වෙමින් සිටියා ය. ටික වේලාවකින් සුළඟක් හැමීම නිසා මෝදු වෙමින් තිබූ වලා පෙළ විසිරී අහස ටිකෙන් ටික එළිය ගෙන දෙන්නට සමත් වීමෙන් පෙර මෙන් ම එය පැහැදිලි බවක් ගෙන දුන්නේ ය. තම ප්‍රාර්ථනාව අම්මාන් දෙවියන්ගේ සවනට වැටුණා යැයි කාමාච්චි සිතුවා ය.

මුරුගේසු රාත්‍රි නින්දට යන්නට පෙර එදින ම කන්දන්ටත්, ගෝවින්දටත් ගොයම් කපන්න එන ලෙස මතක් කරමින් ආපසු නිවසට පැමිණ නිදා ගත්තේ ය. ඔහු නින්දට යනවිට කල් යල් ඉක්ම ගොස් තිබුණි. ඔහු පැදුර මත පෙරළෙමින් නිදා සිටියේ ය. ඔහුට නින්ද එන්නේ කෙසේ ද? ඔහුගේ මනස නින්දත් නොනින්දත් අතර වරින් වර ගැටුමක යෙදී ඇවිදමින් සිටියේ ය. දහසක් සිතුවිලි පිශාචයන් මෙන් ඔහුගේ මනස වෙතට පැමිණ හොල්මන් කළේ ය.

ඔහු කුඹුරෙහි ගොයම් කපමින් සිටියේ ය. අසල ගෝවින්දත්, කන්දයියාත් ගොයම් කපමින් සිටියෝ ය. ඔවුන් විසින් කපන ලද ගොයම් කාමාච්චිත්, පොන්නිත්, සින්නම්මාත් මාපිඩි කරමින් , මිටි බඳිමින් අඩුක්කරමින් සිටියෝ ය. ගිරවුන් සහ කාක්කන් එළවමින් කාමාච්චි, "කම්මලේ යකඩ තලන්නා කොහේද ගියේ" යනුවෙන් ගී ගයන්නට පටන් ගත්තා ය.

එයට ප්‍රතිඋත්තර වශයෙන් 'යකඩ තලන්නා පල්ලමක් බලා වී වපුරන්න ගියා' යනුවෙන් කියන විට කාමාච්චි 'සේරුවත් ගෙන කෝටියක් බලය ද ගෙන.....' යනුවෙන් දෙවැනි පදය පටන් ගත්තා ය.

එයට පොන්නි, කුකුළා හඬලන විට උදැල්ල ගෙන... යනුවෙන් කියන විට ''යකඩ තලන්නා පල්ලම බලා ගොයම් කරන්න ගියා" යනුවෙන් ගීතය ඉවර කළේ ය. ඒ මොහොතේ ම කාමාච්චි 'මිනිසුන් බිම වැටිලා දැකැති බිම වැටිලා, කිවූ විට ඒ මොහොතේ ම මුරුගේසු, "කවුද කවුද"? බිම යනුවෙන් අඩ නින්දෙන් කෑගසමින් නැඟිට්ටේ ය.

මුරුගේසු මිනිස්සු තමන්ට සමච්චල් කරනවා යැයි සිතා වරින් වර තරහ ගත්තේ ය. නින්ද පහව ගිය බැවින් ඔහු කළ දෑ ගැන ඔහුට ම ලැජ්ජාවක් ඇති විය. තමා තුළම සිනහවක් නගා ගනිමින් නැවතත් නින්දට වැටුණේ ය. ඒ සිහිනය කොතරම් ලස්සන සිහිනයක් ද? එහි අනෙක් කොටසත් දැක ගන්න ඔහුට ආශාවක් ඇති විය. එහෙත් නින්ද කෙසේ තමා වෙතට එයි ද? සිහිනය නැවතත් තමා කරා ළඟා වෙයි ද? එම සිහිනයේ ඉතිරි කොටස පරිකල්පනය කර බැලූ ඔහු හදවතට සතුටක් ඇති කරගත්තේ ය.

ගීත සමගින් ගොයම් කැපිල්ල සිදු වෙමින් පවතී. කුඹුරේ සිට වී මිටි තම කරත්තයට නංවා ගනිමින් ඔහු සිටින්නේ ය. කරත්තය ගේ දෙරකඩ අසලට විත් නැවතුණේ ය. ඔහුගේ අස්වනු කාමරය පිරවී පූර්ණත්වයට පත් වේ. රාමන් බඩ පිරෙන්න කිරි කැඳ බොමින් සිටින්නේ ය. කාමාච්චි ඔහු ළඟට විත්.... ඒ මොහොතේ ගෙයි මහලේ සිටි කුකුළෙක් හැඬලුවේ ය. මුරුගේසුගේ කල්පනා සිඳී බිඳී ගියේ ය. එම ග්‍රාමයේ සිටි කුකුළෝ නොනැවතී ම හැඬලීමට පටන් ගත්තෝ ය. සිය නිවස ඉදිරි පස බැඳ දමා තිබූ එළු පැටියා බැහැ බැහැ අනුකරණයෙන් කෑගසන්නට පටන් ගත්තේ ය. කොහේදෝ සිට හොරෙන් හොරෙන් තම නිවසට ඇතුළු වූ සුළඟ

ඔහුගේ සිරුරට වැදීම නිසා ඔහුට සීතලක් දැනෙන්නට විය. මුරුගේසු ඉතා කඩිනමින් නැගිට්ටේ ය. ගේ දෙරකඩින් නිකමට අහස දෙස බෙල්ල උස්සා බැලුවේ ය.

ඔහු නිදියන්නට පෙර අහසේ දක්නට ලැබුණ කිසිදු තරුවක් දකින්නට නොලැබුණේ ය. අහස අඳුරු වී ඝන වී කිසියම් දෙයක එල්ලීගෙන තිබෙන සෙයක් ඔහුට දිස් විණ. නිවසේ මිදුලට විත් ඔහු සිට ගත්තේ ය. එක වැහි පොදක් ඔහුගේ හිස මත පතිත විය. අත දිග හැරියේ ය. තවත් එක පොදක් ! අනෙක් අත ද දිග හැරියේ ය. පොද දෙකක් වැටිණි. ඔහුගේ හිසමතට අහස කඩා ගෙන වැටෙන සෙයක් ඔහුට දැනිණි.

ඊළඟ මොහොතේ ඔහු මඩුවෙහි හිඳ ගත්තේ ය. දෙඩම් ගෙඩි තරම් වැහි බිංදු වැටෙන්නට පටන් ගත්තේ ය. අකුණු ගසන්නට පටන් ගත්තේ ය. විදුලි කොටමින් මොරසූරන්නා සේ වැස්ස පැවතියේ ය.

උදේ හත පසු වුණත් වැස්ස නැවතුණේ නැත. රාමු, දුවගෙනවිත් පියා අසල සීතල තපිමින් හුන්නේ ය. කාමාච්චි තක්බීරි වී බලා සිටියා ය. වැස්ස සමග සුළඟත් එකට මුසු වෙමින් හෝ හෝ .... අනුකරණ ශබ්ද නගමින් තිබුණේ ය.

"අම්මේ අද කිරි කැඳ දෙනවා කියලා කිව්වා නේ ද? බොරු නේ ද කිව්වේ" මව දෙස බැලූ රාමු ඇසුවේ ය.

කුමක් කියන්න දැයි කාමාච්චිට තේරුනේ නැත. ඇගේ පපුව ද ගෙන ගියේ ය. කිරිසප්පයා දින කීයක් නම් රවට්ටා ගෙන ආවා ද? කාමාච්චි වැස්ස නොබලා අල්ලපු ගෙදරට දිව ගිහින් හාල් හුණ්ඩුවක් ඉල්ලා ගෙන ආවා ය. මුරුගේසු කිසිවක් නොකියා අහස දෙස බලාගත් වන ම සිටියේ ය. ඔහුගේ බැල්ම කුඹුර දෙසට දිව ගොස් කොහෙදෝ තැනකට සීමා වී තිබුණි.

වක්කඩින් ඉතිරී යන තෙක් ම වතුර කුඹුරෙහි පිරී තිබුණේ ය. දැන් දැන් වැව පිරී ඉතිරී ගංවතුරක් ගලන්න පුළුවන. පැහිච්ච ගොයම බිමට නැමී වැටී සියල්ල ම බිම දිගා විය. වී ගස් සියල්ලේ ම වී කරල් පෙඟී ගංවතුරත් සමඟ ගසා ගෙන යමින් තිබෙනවා යැයි සිතූ ඔහු සුසුමක් හෙළුවේ ය.

කාමාච්චි අස්වැන්න දමන කාමරය වෙතට ගියා ය. එය හිස් ව තිබෙණු දුටු විගස ඇයට ඉකි ගසා ඇඬුම් එන්නට පටන් ගත්තාය. එහි සිටීම ඉවසුම් දිය නොහැකි බැවින් ඕ කාමරයෙන් එළියට ආවා ය. "හෙටත් කිරි කැඳ දෙනවා ද අම්මේ" යනුවෙන් රාමු බැගෑපත් ලෙස ඇසුවේ ය. ඔහු කැඳ බිව් කෝප්පය ඇය ඉදිරියේ හිස්ව තිබුණේ ය.

බොහෝ දවස්වලට පුරුද්දෙන් වාගේ, "හෙට...." යන වචනය පමණක් මිමිණීමට ඇයට හැකි විය. ඒ අඩුපාඩු සහිත වචන මුරුගේසුගේ කටෙහි තිබුණි. ඒ සියලු ම වචන ඔහුගේ කටට ගිනි එකතු කළාක් මෙන් දැනිණ.

## ක්‍රියාකාරකම්

1. පාඩම කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

   i. රාමුගේ දෙමවුපියෝ කවරහු ද?

   ii. ඔවුන්ගේ කුඹුර අසල ම තිබුණේ කුමක් ද?

   iii. කුඹුරට කැඳ ගෙන ගිය විට මුරුගේසු කාමාච්චිට කීවේ මොනවා ද?

   iv. ගොයම් කැපීම සඳහා ආරාධනා කළ යුතු යැයි මුරුගේසු සිතුවේ කවුරුන් ගැන ද?

   v. මුරුගේසු දුටු සිහිනය විස්තර කරන්න.

**භාෂා භාවිතය**

1. පහත සඳහන් වාක්‍ය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ ලකුණු කරන්න.

   i. මුරුගේසු නින්දෙන් කෑ ගසමින් නැගිට්ටේ ය. ( )

   ii. ඔහු කුඹුරෙහි ගොයම් කපමින් සිටියෝ ය. ( )

   iii. සුන්සාල් කැඳ රැගෙන කාමාච්චි එමින් සිටියා ය. ( )

   iv. රාමු සෙල්ලම් කිරීමට දිව ගියෝ ය. ( )

   v. සියල්ලෝම ගී ගයමින් වැඩ ඇරඹුවෝ ය. ( )

2. හිස්තැනට සුදුසු වචනය පාඩමෙන් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

   i. ගෝවින්දත් කන්දයියාත් ................................................ කපමින් සිටියෝ ය.

   ii. ................................................ ගසන්නට පටන් ගත්තේ ය.

   iii. අහස ................................................ වී සන වී කිසියම් දෙයක් එල්ලීගෙන තිබෙන සෙයක් ඔහුට දිස්විණ.

   iv. විදුලි කොටමින් මොර සූරන සේ ................................................ පැවතියේ ය.

   v. ................................................ ඉතිරී යන තෙක් ම කුඹුරෙහි වතුර පිරී තිබුණේ ය.

3. පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරින් දැක්වෙන පදවලට සමානාර්ථ පද ලියන්න.

   i. **වැස්ස** වැටෙන්නට පටන් ගත්තේ ය.

   ii. කුඹුරෙහි **වතුර** පිරී තිබුණේ ය.

   iii. **මව** දෙස බැලූ රාමු මෙසේ ඇසුවේ ය.

   iv. **අහසෙහි** කිසිදු තරුවක් දකින්න නොලැබුණේ ය.

   v. **සුළඟ** නිසා පහන නිවී ගියේ ය.

4. පහත සඳහන් වචනවලට විරුද්ධ වචන ලියන්න.

   i. අලුත්

   ii. අඳුර

   iii. දුර

   iv. අහස

   v. හොඳ

   vi. ඉක්මන්

   vii. සුදුසු

   vii. වැස්ස

5. පහත සඳහන් වචන යොදා වාක්‍ය තනන්න.

   i. අස්වැන්න

   ii. ගංවතුර

   iii. බඩගිනි

   iv. කුඹුර

   v. අහස

   vi. අවුරුද්ද

   vii. මාසය

6. පහත සඳහන් වාක්‍යවල උක්තය හා ආඛ්‍යාතය නිවැරැදි ව ගළපා නැවත ඔබේ පොතේ ලියන්න.

  i. දැරිය මල් කැඩුවෝ ය.

  ii. කුරුල්ලෝ ආහාර සොයා පියාඹයි.

  iii. නංගී ඉකිගසා හැඬූහ.

  iv. අපි මඟුල් ගෙදර යමි.

  v. මම කෝවිලට ගියෙමු.

7. පහත දැක්වෙන වචන පේළිවල ඇතුළත් නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා ඔබේ පොතේ ලියන්න.

  i. (වළාකුළු, වලාකුළ, වළාකුළ)

  ii. (ශබ්දය, ෂබ්දය, ශබ්ධය)

  iii. (ප්‍රාර්තනාව, ප්‍රාර්ථනාව, ප්‍රාර්ථණාව)

  iv. (වර්ණය, වර්නය, වරනය)

  v. (කලබලය, කළබලය, කලබළය)

  vi. (නිර්මල, නිර්මළ, ණිර්මල)

  vii. (අනුරාදපුර,අනුරාධපුර, අණුරාධපුර)

  viii. (රණදෙරණ, රනදෙරන, රණදෙරන)

  ix. (නිලධරයා, නිළදරයා, නිළධරයා)

  x. (සෙවනැල්ල, සෙවණැල්ල, සෙවණැල්ළ)

8. වරහන තුළ දී ඇති වචනවලින් සුදුසු වචනය තෝරා වාක්‍ය සම්පූර්ණ කර ඔබේ අභ්‍යාස පොතේ ලියන්න.

(ගොයම්, ගී, පපුව, කුඹුර, තරුවක්)

i. මුරුගේසු ............................................................ කොටයි.

ii. ගෝවින්ද සහ කන්දන් ............................................................ කපමින් සිටියෝ ය.

iii. කාමාච්චී ............................................................ ගයන්නට පටන් ගත්තා ය.

iv. අහසේ කිසිදු ............................................................ දකින්න නොලැබුණේ ය.

v. ඇගේ ............................................................ පිච්චී ගෙන ගියේ ය.

9. පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට සුදුසු ක්‍රියාපද තෝරා ඔබගේ අභ්‍යාස පොතේ ලියන්න.

i. නංගී පාඩම හොඳින් ...................................... (කියවති / කියවන්නී ය).

ii. අපි ශ්‍රමදානයට සහභාගි ...................................... (විය / වූයෙමු).


iii. ශිෂ්‍යයෝ සංචාරයට සහභාගි ...................................... (විය / වූහ).

iv. මම ගමට යෑමට පිටත් ...................................... (වෙයි / වූයෙමි).

v. ඔවුහු ශ්‍රමදානයට සහභාගි ...................................... (වූවෙමු / වූහ).

10. පහත සඳහන් කව අතරින් පළමු කවයෙහි ඇතුළත් නාමපදවලට ගැළපෙන ක්‍රියාපද දෙවන කවයෙන් තෝරා වාක්‍ය තනන්න.

පළමුවන කවය




දෙවන කවය

